// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2208/7 – 2020 දෙසැම්බර් 28 වැනි සඳුදා – 2020.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/04/2017/54 - i.
IR/COM/04/2017/219.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2020.06.30 වන දින අංක 2182/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2020.04.03 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජයන්ති තිරාණගම ඇතුළු සේවක පිරිස, දනවල, නෙළුව.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

තේ ශක්ති අරමුදල, 8 වන මහල, සෙත්සිරිපාය II වන අදියරය, බත්තරමුල්ල.

අතර පවත්නා 2020.01.18 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩී. එම්. කරුණාරත්න මහතා වෙත යොමු කරන ලදී.

1A – G 33377 – 45(2020/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2020.04.03 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2017/54-i.
IR/COM/04/2017/219.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජයන්ත තිරාණගම ඇතුළු සේවක පිරිස, දනවල, නෙළුව.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

තේ ශක්ති අරමුදල, 8 වන මහල, සෙත්සිරිපාය II වන අදියරය, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාලබේ, කහන්තොට, මල්වත්ත පාර, අංක 224/14 ඒ, කේ. ඒ. පියරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2017/54-i.
: IR/COM/04/2017/219.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජයන්ත තිරාණගම ඇතුළු සේවක පිරිස, දනවල, නෙළුව.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

තේ ශක්ති අරමුදල, 8 වන මහල, සෙත්සිරිපාය II වන අදියරය, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''තේ ශක්ති අරමුදල සතු කම්හල් වසා දැමීම හේතුව මත තේ ශක්ති අරමුදලේ සේවය කළ ජයන්ත තිරාණගම මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 08 දෙනාගේ සේවය 2016.12.31 දින සිට අවසන් කිරීමේදී වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව තිබියදී විශ්‍රාම යැවීමේ වයස අවුරුදු 55 ලෙස සලකා වන්දි ගණනය කිරීම මගින් අසාධාරණයක් සිදුවී තිබේද? එසේ සිදුවී තිබේ නම් ඔවුනට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.''

| | | | |
|---|---|---|---|
| 01. | ජයන්ත තිරාණගම | 05. | පසන් වටවල |
| 02. | ඒ. ඩබ්. කුමාරසිරි | 06. | ප්‍රියන්ත බාලපටබැඳි |
| 03. | එම්. පී. නීතා රත්නකුමාරි | 07. | ඩබ්ලිව්. එම්. ධර්මසිරි |
| 04. | එම්. කේ. අනුර සරත් කුමාර | 08. | ඩබ්. ඩබ්. සී. සී. කුමාර |

**බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 - 40

---

මගේ අංකය : IR/COM/02/2016/127 .

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2017.11.15 වන දින අංක 2045/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.11.10 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. සී. එම්. ඩී. අමරවර්ධන මයා, අංක 407 ඩී, බටපොත පරණ පාර, අකුරේගොඩ, බත්තරමුල්ල. 2. ආර්. ඒ. ආර්. රූපසිංහ මයා, අංක 62/8 ඒ, අලකේෂ්වර පාර, ඇතුල්කෝට්ටේ.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

සෙලාන් බැන්ක් පීඑල්සී, සෙලාන් ටවර්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

අතර පවත්නා 2017.10.03 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ටී. පියසෝම මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දූන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2017.11.10 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2016/127.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*
1. සී. එම්. ඩී. අමරවර්ධන මයා, අංක 407 ඩී, බටපොත පරණ පාර, අකුරේගොඩ, බත්තරමුල්ල. 2. ආර්. ඒ. ආර්. රූපසිංහ මයා, අංක 62/8 ඒ, අලකේෂ්වර පාර, ඇතුල්කෝට්ටේ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සෙලාන් බැන්ක් පීඑල්සී, සෙලාන් ටවර්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතර, පඹුරණ, අබේගුණරත්න මාවත, අංක 10/ඒ, ඒ.ඒ. වීරසූරි මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2016/127.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. සී. එම්. ඩී. අමරවර්ධන මයා, අංක 407 ඩී, බටපොත පරණ පාර, අකුරේගොඩ, බත්තරමුල්ල. 2. ආර්. ඒ. ආර්. රූපසිංහ මයා, අංක 62/8 ඒ, අලකේෂ්වර පාර, ඇතුල්කෝට්ටේ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සෙලාන් බැන්ක් පීඑල්සී, සෙලාන් ටවර්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''සෙලාන් බැන්ක් පීඑල්සී හි සේවය කරන ලද සී. එම්. ඩී. අමරවර්ධන මහතා සහ ආර්. ඒ. ආර්. රූපසිංහ මහතා පිළිවෙලින් 2009.12.06 දින සහ 2011.10.05 දින විශ්‍රාම ගැන්වීම යුක්ති සහගත වන්නේ ද යන්න සහ යුක්ති සහගත නොවන්නේ නම්, ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

**බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 - 41

---

මගේ අංකය: IR/COM/03/2018/288.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. එම්. ඒ. ඩබ්ලිව්. කුමාරසිරි මයා, අංක 155/බී, කඳුබොඩ, දෙල්ගොඩ. 2. යූ. ආර්. නිශානි සෝමසිංහ මිය, අංක 17, කුරුළු උයන, පැලවත්ත, පන්නිපිටිය. 3. ඩබ්ලිව්. පී. අයි. ඩබ්ලිව්. එදිරිසිංහ මයා, අංක 77/2, මුවගමුව, බෙම්මුල්ල. (ඇතුළු සේවකයින් 19 දෙනා)

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතර, පඹුරණ, අබේගුණරත්න මාවත, අංක 10/A, ඒ. ඒ. වීරසූරි මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2018/288.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. එම්. ඒ. ඩබ්ලිව්. කුමාරසිරි මයා, අංක 155/බී, කඳුබොඩ, දෙල්ගොඩ. 2. යූ. ආර්. නිශානි සෝමසිංහ මිය, අංක 17, කුරුළු උයන, පැලවත්ත, පන්නිපිටිය. 3. ඩබ්ලිව්. පී. අයි. ඩබ්ලිව්. එදිරිසිංහ මයා, අංක 77/2, මුවගමුව, බෙම්මුල්ල. (ඇතුළු සේවකයින් 19 දෙනා)

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

1. "ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ සේවය කරන එම්. ඒ. ඩබ්ලිව්. කුමාරසිරි මයා ඇතුළු පහත අංක 01 සිට 19 දක්වා නම් සඳහන් සේවකයින් 19 දෙනාහට සේවා කාලයට ගැලපෙන සේ උසස්වීම් ක්‍රමවේදයක් ලබා නොදීම සහ අදාළ වැටුප් පියවරේ නොතැබීම මගින් යම් අසාධාරණයක් සිදුව තිබේනම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහන කවරේද යන්නත්,
2. මෙහි අංක 01 සිට 15 දක්වා නම් සඳහන් සේවකයින් 15 දෙනා බඳවා ගැනීමේදී ලිපිකරු තනතුරට අදාළ ශ්‍රේණියට ඇතුළත් නොකිරීම මගින් යම් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහන කවරේද යන්නත්, පිළිබඳව වේ.

| | | | |
|---|---|---|---|
| 01. | ඩබ්. පී. අයි. ඩබ්. එදිරිසිංහ | 11. | ලියනගේ චන්ද්‍රසීලි |
| 02. | කේ. නිහාල් රංජිත් | 12. | එස්. කරුණාරත්න |
| 03. | ජී. ඒ. එස්. කරුණාරත්න | 13. | එම්. ඒ. ඩබ්. කුමාරසිරි |
| 04. | ඩබ්. එල්. අතුල රෝහණසිරි | 14. | ඩී. එස්. ලියනගේ |
| 05. | ක්‍රිශාන්ති තාමනී | 15. | පී. එල්. සී. ජය ලක්ෂ්මි |
| 06. | චම්පිකා හෙට්ටිආරච්චි | 16. | ආශා තරංගනී |

07. අජන්තා කළුආරච්චි
08. දීපා පෙරේරා
09. නිශානි සෝමසිංහ
10. ඒ. ඩී. සුනිල්
17. කේ. එල්. එල්. එස්. ධර්මරත්න
18. නදීශානි ද සිල්වා
19. දුලීකා නිශාන්ත

**බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 - 42

---

මගේ අංකය : IR/15/10/2010 .

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2012.08.30 වන දින අංක 1773/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.08.09 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ලංකා ආරක්ෂක සේවා සංගමය, අංක 103, පී.එස්.පෙරේරා මාවත, මාම්පේ, පිලියන්දල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර පවත්නා 2012.08.03 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ටී. පියසෝම මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2018.08.09 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/10/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ලංකා ආරක්ෂක සේවා සංගමය, අංක 103, පී.එස්.පෙරේරා මාවත, මාම්පේ, පිලියන්දල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බණ්ඩාරවෙල, මීරියගහ, උඩපේරුව පාර, කුමුදුනී, නීතිඥ ජයසේකර මුදියන්සේලාගේ කපිල ජයසේකර මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/10/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ලංකා ආරක්ෂක සේවා සංගමය, අංක 103, පී.එස්.පෙරේරා මාවත, මාම්පේ, පිලියන්දල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

I. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ආරක්ෂක අංශ සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ දී/ පුරප්පාඩු පිරවීමේදී පිටතින් සේවකයින් බඳවා ගැනීම තුළ සුදුසුකම් ලත් ආයතනයේ සේවකයින්ට අවස්ථාවක් නොලැබීමෙන් අසාධාරණයක් සිදු වී ඇත්ද යන්න හා එසේ වී නම් ඔවුනට කුමන සහන හිමිවිය යුතු ද යන්න,

II. ආරක්ෂක නියාමක 1 ශ්‍රේණියේ නිලධාරීන් විශාල පිරිසක් සඳහා උසස්වීම් නොලැබීම හා සුදුසුකම් සපුරා ඇතත් උසස්වීම් නොලබා ඔවුන් සිටි ශ්‍රේණියේම විශ්‍රාම යාමට සිදුවීම නිසා අසාධාරණයක් සිදුව ඇද්ද යන්න හා එසේ වී නම් ඔවුනට කුමන සහන හිමිවිය යුතු ද යන්න,

III. සමහර ආරක්ෂක නිලධාරින්ට පිළිගත් උසස්වීම් පටිපාටිය උල්ලංඝනය කරමින් උසස්වීම් ලබාදීම හේතුවෙන් සුදුසුකම් සහිත සෙසු ආරක්ෂක නිලධාරින්ට අසාධාරණයක් සිදුව ඇද්ද යන්න හා එසේ වී නම් ඔවුනට කුමන සහන හිමිවිය යුතු ද යන්න,

IV. සුදුසුකම් ලබා ඇති ආරක්ෂක නිලධාරින්ට විශ්‍රාම යෑමට පෙර ආරක්ෂක නියාමක 1 වෙනි ශ්‍රේණියේ නිලධාරීන්ට හිමි උසස්වීම් ලබා නොදීම නිසා අසාධාරණයක් සිදුව ඇද්ද යන්න හා එසේ වී නම් ඔවුනට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දීන යොදන ලදී.

01 - 43